# Recall Biology -17 සඳහා පිළිතුරු

## I කොටස

**බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු**

| | | | | |
|---|---|---|---|---|
| 1) 4 | 3) 4 | 5) 2 | 7) 4 | 9) 1 |
| 2) 3 | 4) 3 | 6) 5 | 8) 5 | 10) 1 |

## A කොටස ( ව්‍යුහගත රචනා)

1. (A) (i) * දේහයේ පාලන යාන්ත්‍රණවලට ප්‍රතිචාර නොදැක්වීම.
* අධික සීඝ්‍රතාවයකින් ගුණනය වීම.

(ii) * ඔවුන් විසින්ම වර්ධක සාධක සාදා ගැනීම හෝ වර්ධක සාධක නොමැතිව සෛල චක්‍රය ඉදිරියට ගෙන යාම

(iii) * සාමාන්‍ය සෛලයක්, අසාමාන්‍ය සෛලයක් බවට පත් වීමේ ක්‍රියාවලිය

(iv) * සෝපාද්‍ර අර්බුධ * නිරුපද්‍ර අර්බුධය

(B) (i) * එක් මාතෘ න්‍යෂ්ටියකින්, ප්‍රවේණිකව සර්වසම දුහිතෘ න්‍යෂ්ටි දෙකක් සෑදෙන පරිදි සිදුවන න්‍යෂ්ටි විභාජන ක්‍රියාවලියයි.

(ii) * S කලාව / සංස්ලේෂණ කලාව

(iii) * පේශි සෛල

(iv) * ප්‍රතිවිරුද්ධ ධ්‍රැවවල ඇති වර්ණදේහ කට්ටල වටා න්‍යෂ්ටි ආවරණය සෑදීම
* න්‍යෂ්ටිකතාව නැවත දර්ශනය වීම.
* තර්කු ක්ෂුද්‍රනාලිකා විබහුඅවයවීකරණය වීම.
*ක්‍රොමැටින් සෑදීමට වර්ණදේහ ලෙහී, ඝනවීම අඩුවීම.

(C)(i) * පෘථිවි පෘෂ්ඨයේ ආදිතම පාෂාණය ඇතිවීම.
* ආදිතම සෛලවල පොසිල ඇතිවීම.
* වායුගොලීය $O_2$ සාන්ද්‍රණය ඉහළ නැගීම ආරම්භ වීම.

(ii) * ජලය හා ඛනිජ ලවණ පරිවහනය සඳහා සනාල පටක ඇතිවීම.
* ජල හානිය වැළැක්වීම සඳහා ජලයට අපාරගම්‍ය ඉටි ආවරණයක් ඇති වීම.

(iii) * වහරය හා අවහරය * පරිචිත ලක්ෂණ සම්ප්‍රේෂණය

(iv) * අධිජනනය * ප්‍රභේදනය * තරගය හා උච්චතෝන්නතිය
* හිතකර ලක්ෂණ ස්වාභාවික වරණයට ලක්වීම.

(D) (i) * ග්‍රෑම් ධන * ග්‍රෑම් ඍණ

(ii) * ක්ෂුද්‍ර නාලිකා ( 9 + 2) ව්‍යුහය නොදැරීම. * ප්ලාස්ම පටලයකින් ආවරණය නොවීම.

(iii) * *Rhizobium* * සමහර සයනො බැක්ටීරියා (*Anabaena/ Nostoc*)

(iv) * ෆෝමයිල් මෙතියොනින්